ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1984 අංක 38 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන පනත)

---

[සහතිකය සටහන් කළේ 1984 ඔක්තෝබර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 38 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ඔක්තෝබර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 52/82

**1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 38 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනතේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

1980 අංක 27 දරන පනතේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ඖෂධ නිෂ්පාදනය කිරීම ආදියට තැනැත්තන් සහ ස්ථාන සඳහා බලපත්‍ර දීම.

9. (1) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව, කිසිම තැනැත්තකු විසින් යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ මතය අනුව සාමාන්‍ය පාවිච්චිය සඳහා ආරක්ෂා සහිත වන්නා වූ ද මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද ඖෂධයක් හැර, කිසිම ඖෂධයක් විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව, කිසිම තැනැත්තකු විසින් ගබඩා කිරීම, විකිණීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකරනු ලැබිය යුතු ය.

(3) යම් ස්ථානයක් සඳහා විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් බලපත්‍රයක් දී ඇත් නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ ස්ථානයෙහි යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීම හෝ පිළියෙල කිරීම නොකරනු ලැබිය යුතු ය.

(4) යම් ස්ථානයක් සඳහා විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් බලපත්‍රයක් දී ඇත් නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ ස්ථානයෙහි, අමාත්‍යවරයාගේ මතය අනුව සාමාන්‍ය පාවිච්චිය සඳහා ආරක්ෂා සහිත වන්නා වූ ද මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද ඖෂධයක් හැර, යම් ඖෂධයක් ගබඩා කිරීම හෝ විකිණීම නොකරනු ලැබිය යුතු ය.".

3. පහත දැක්වෙන අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 10අ, 10ආ හා 10ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 10අ, 10ආ හා 10ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"විලවුන් සන්තකයෙහි තබා ගැනීම තහනම් කිරීම.

10අ. අමාත්‍යවරයාගේ මතය අනුව, පාවිච්චි කරන්නාගේ සෞඛ්‍යයට හානිකර වන්නා වූ ද මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද විලවුන් කිසිවක් "උ" උපලේඛනයෙහි විස්තර කර ඇති තැනැත්තන් හැර කිසිම තැනැත්තකු විසින් ලබා ගැනීම හෝ තමාගේ සන්තකයෙහි තබා ගැනීම හෝ නොකරනු ලැබිය යුතු ය.

උපකරණ සන්තකයෙහි තබා ගැනීම තහනම් කිරීම.

10ආ. අමාත්‍යවරයාගේ මතය අනුව සාමාන්‍ය පාවිච්චිය සඳහා ආරක්ෂා සහිත නොවන්නා වූ ද මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද යම් උපකරණයක්, "උ" උපලේඛනයෙහි විස්තර කර ඇති තැනැත්තන් හැර කිසිම තැනැත්තකු විසින් ලබා ගැනීම හෝ තමාගේ සන්තකයෙහි තබා ගැනීම හෝ නොකරනු ලැබිය යුතු ය.

ඖෂධ සන්තකයෙහි තබා ගැනීම තහනම් කිරීම.

10ඇ. අමාත්‍යවරයාගේ මතය අනුව සාමාන්‍ය පාවිච්චිය සඳහා ආරක්ෂා සහිත නොවන්නා වූ ද මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ ද යම් ඖෂධයක්, "උ" උපලේඛනයෙහි විස්තර කර ඇති තැනැත්තන් හැර කිසිම තැනැත්තකු විසින් ලබා ගැනීම හෝ තමාගේ සන්තකයෙහි තබා ගැනීම හෝ නොකරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ඇතැම් ඖෂධ විකිණීම ආදිය තහනම් කිරීම.

16. 'ඉ' උපලේඛනයෙහි විස්තර කෙරෙන යම් ඖෂධයක් කිසිම තැනැත්තකු විසින් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, විකිණීම, බෙදාහැරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ තමාගේ සන්තකයෙහි තබා ගැනීම නොකරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) එම උපවගන්තියේ (ග) ඡේදයෙහි ඇති "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්; සහ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එම උපවගන්තියේ (ච) ඡේදයෙහි ඇති " ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්." යන වචන වෙනුවට " ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන් :—

" (ජ) ශ්‍රී ලංකා සාමාන්‍ය වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක් ;

(ට) කාය වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක් ; සහ

(ඩ) ශ්‍රී ලංකා ප්‍රසව වෛද්‍යවරුන්ගේ සහ ස්ත්‍රී චිකිත්සා වෛද්‍යවරුන්ගේ විද්‍යාලය විසින් නම් කරනු ලබන ඒ විද්‍යාලයේ නියෝජිතයෙක්.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි " (1) වන උපවගන්තියෙහි (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග) හෝ (ච) ඡේදයන් " යන යෙදුම වෙනුවට " (1) වන උපවගන්තියෙහි (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග), (ච), (ජ), (ට) හෝ (ඩ) ඡේදයන් " යන යෙදුම ආදේශ කිරීමෙන්.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; හා

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය (2) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්.

7. පහත දැක්වෙන අලුත් වගන්තිය 20 වන වගන්තියට ඉක්බිතිව ම මින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

" ඖෂධ ලියාපදිංචි කිරීම.

20අ. (1) විලවුන්, උපකරණ සහ ඖෂධ සෑම කක් ම අධිකාරිය වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත ලියාපදිංචි කරනු නො ලැබූ විලවුන්, උපකරණ හෝ ඖෂධ කිසිවක් කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම, ගබඩා කිරීම, විකිණීම, බෙදා හැරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීමට තැබීම හෝ ප්‍රචාරය කිරීම නොකරනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඕ) යම් විලවුන්, උපකරණ හෝ ඖෂධ ලියාපදිංචි කරනු ලැබිය යුතු ක්‍රමය හා ආකාරය, ඒ ලියාපදිංචි කිරීමට අදාළ නියමයන් හා කොන්දේසි, ඒ ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු හා, ඒ ලියාපදිංචි කිරීමට සම්බන්ධ වෙනත් යම් කරුණු;

(ක) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ වූ වරදක්, යම් විලවුන්, උපකරණ හෝ ඖෂධ සම්බන්ධයෙන් සිදුකරන ලද අවස්ථාවක, ඒ විලවුන්, උපකරණ හෝ ඖෂධ විනාශ කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය එනි "ඊ" උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'"උ" උපලේඛනය

(අ) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ, ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙක්, දන්ත වෛද්‍යවරයෙක් හෝ ඖෂධ වේදියෙක් හෝ 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ ලියාපදිංචි වූ පශු වෛද්‍යවරයෙක්;

(ආ) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය මගින් නිකුත් කරන ලද බලපත්‍රයක් දරන යම් තැනැත්තෙක්;

(ඇ) වෛද්‍ය වෘත්තිකයකු විසින් දෙන ලද බෙහෙත් වට්ටෝරුවක් මත ඖෂධයක් ලබා ගන් යම් තැනැත්තෙක්;

(ඈ) ලියාපදිංචි කරනු ලැබූ ආරෝග්‍යශාලාවක්, චිකිත්සාගාරයක්, සාත්තු නිවාසයක් හෝ වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය, දන්ත වෛද්‍ය හෝ පශු වෛද්‍ය ප්‍රතිකාර සලසන වෙනත් ආයතනයක් භාරව කටයුතු කරන යම් තැනැත්තෙක් හෝ එවැනි ස්ථානයක් ඇතුළත එවැනි තැනැත්තකුගේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තෙක්;

(ඉ) පරීක්ෂණාගාරයක් භාරව සිටින යම් තැනැත්තෙක් හෝ විද්‍යා අධ්‍යාපනය හෝ පර්යේෂණ පවත්වාගෙන යාම තම කාර්යභාරය වන්නා වූ හෝ කර්තව්‍යයන් අතර ඇත්තා වූ යම් තැනැත්තෙක් හෝ එවැනි තැනැත්තකුගේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තෙක්;

(ඊ) ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, අනුමත කරන ලද විශ්ලේෂකවරයා හෝ අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකවරයා;

(උ) වෛද්‍ය සැපයීම් රැගෙන යන නැවක හෝ ගුවන් යානයක අයිතිකරු හෝ එවැනි නැවක හෝ ගුවන් යානයක නෞකාධිපති හෝ නියමුවා;

(ඌ) තම කාර්ය ඉටු කරන අවස්ථාවේ දී විලවුන්, උපකරණ සහ ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිදුවන යම් රජයේ නිලධරයෙක්.'